# අනගාරික ධර්මපාලතුමාගේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයෙහි ක්‍රියාකරීත්වය

**ලක්ෂ්මන්ත වසන්ත වාසුලගේ**
*lakshmantha@gmail.com*

අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් ලක්දිව පහළ වූ යුග පුරුෂයන් අතර අග්‍රගණ්‍ය වේ. එතුමානන්ගේ තරම් විශ්ව ව්‍යාප්ත සේවා දායකත්වයක් වෙනත් කිසිදු ශ්‍රී ලාංකිකයෙකුගෙන් සිදු නොවූ අතර, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ ක්ෂේත්‍රයන් විෂයෙහි කරන ලද අතිමහත් උදාර සේවාවන්ගෙන් එතුමාණන් ලංකාවට ලබාදුන් කීර්තිය අප කිසිදු ශ්‍රී ලාංකිකයෙකුට අමතක කළ නොහැකිය. ශ්‍රී ලාංකිකත්වය හා බුද්ධ ශාසනය නගා සිටුවීම තේමාව කොට ගෙන බුදු දහමින් ප්‍රභාමත් වූ ශ්‍රී ලාංකීය ප්‍රෞඪත්වය යළි ඉස්මතු කරලීම සඳහා ශ්‍රී ලාංකික බෞද්ධයින් උනන්දු කරලීමක් අප්‍රතිහත ධෛර්යයෙන් මුළු ලක්දිව පුරාම එතුමා ගෙන ගිය අවිහිංසාවාදී එහෙත් ප්‍රතාපවත් ව්‍යාපාරය ශ්‍රී ලාංකික ජාතික ව්‍යාපාරයේ පදනම වූවාට කිසිදු විවාදයක් නොමැත. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයේ බලපෑමෙන් අධිරාජ්‍යවාදී ගැති මානසිකත්වයෙන් වෙළෙමින් බුදු දහම, බොදු වත් පිළිවෙත් හා සංස්කෘතිය වල් වැදෙමින් පැවති යුගයක ඒ සියල්ල පුනරුත්ථාපනය කිරීම සඳහා එතුමන් නැගූ අභීත හඬ නොවන්නට බුදු දහමින් ඔප් නැංවුණු ශ්‍රී ලාංකික අනන්‍යතාවය මුලුමනින්ම වියකී යන්නට ඉඩ තිබිණි.

සූදුව, මත්ද්‍රව්‍ය භාවිතය, සත්ත්ව ඝාතනය වැනි දුරාචාරයන්ගෙන් ජනතාව මුදා ඔවුන් බෞද්ධ සදාචාර ප්‍රතිපත්තීන් හි පිහිටුවීමටත්, වෙලී සිටි කුසීත භාවයෙන් ඔවුන් අත්මුදවා දෙපයින් නැගී සිටිය හැකි ප්‍රබෝධමත් ජනතාවක් බවට පත් කිරීමට එතුමා දැරූ ව්‍යායාමය අතිශයින්ම ප්‍රශංසනීය විය. අධිරාජ්‍යවාදී බලපෑම් මධ්‍යයේ වුව ද අභීතව සිංහලීලාවෙන් නැගී සිට බෞද්ධයන් අන්‍යාගමීකරණයෙන් මුදවා ගැනීමට එතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ගය කිසිසේත් ම බෞද්ධ විරෝධී ත්‍රස්තවාදී ස්වරූපයක් නොගත්තේය. සුඛෝපභෝගයෙන් විසිය හැකිව තිබූ ගෘහ ජීවිතය බුදු සසුනේ අභිවෘද්ධිය හා උන්නතිය වෙනුවෙන් අත්හල අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් තමන්ට උරුමයෙන් හිමි වූ ධනස්කන්ධය බුදු සසුන, බෞද්ධ සංස්කෘතිය හා බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් කැප කළ මහා ප්‍රතාපවත් යුග පුරුෂයෙකි.

මෙහිදී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩක් කොට සැලකෙන බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් පූජනීය ස්ථානය වූ බුද්ධගයාව දිවි පරදුවට තබා හින්දු මහන්තාවරුන්ගේ පාලනයෙන් මුදාගෙන යළි බෞද්ධ ජනතාව අතට පත්කර දීමෙන් එතුමා කළ අති විශිෂ්ට සේවය කිසිදු බෞද්ධයෙකුට අමතක කළ හැක්කක් නොවේ. දෙස, බස, රැකගැනීම වෙනුවෙන් බෞද්ධ

ප්‍රබෝධයේ දේශීයත්වය මතු කරගැනීම වෙනුවෙන් සිදුකරන ලද ව්‍යාපාරය වඩාත් වැදගත් වේ.

යටත්විජිත පාලන ක්‍රමය මෙරට තහවුරු වීමත් සමඟ දිවයිනේ බහුතර ජන කොටස වන බෞද්ධයන්ට සහ බුද්ධ ශාසනයට බොහෝ සෙයින් සිදු වූයේ යහපත් ප්‍රතිඵලයන්ට වඩා අයහපත් ප්‍රතිඵලයන් ය. බෞද්ධ මහජනතාවට සිදුවුණු මේ අසාධාරණය වඩාත් කැපී පෙනෙන්නට වූයේ මෙරට බ්‍රිතාන්‍ය පාලන සමය තුළදීය. ඉංග්‍රිසි පාලන සමාරම්භය තුළ ම ඔවුන් බෞද්ධ ජනතාව හා බුදුදහම මැඬලීමට භාවිතා කළ ප්‍රබලතම උපක්‍රමය වූයේ මෙරට ක්‍රිස්තියානි ආගම පැතිරවීමයි. එකල දිවයිනට පැමිණි බැප්ටිස් (ක්‍රි.ව. 1812) වෙස්ලියන් (ක්‍රි.ව. 1814) ඇමරිකන් (ක්‍රි.ව. 1816) හා චර්ච් (ක්‍රි.ව. 1818) යන මිෂනාරි සංවිධාන මෙරට ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරය ව්‍යාප්ත කරන ලද පුරෝගාමිකයෝ වූහ. මුද්‍රණ ශිල්පය මෙරට ව්‍යාප්ත වී යෑමත් සමඟ ක්‍රිස්තියානි ධර්මය පතුරුවා හැරීමේ ව්‍යාපාරය ඉතා සාර්ථක අන්දමින් සිදු කොට ඇති බව පෙනේ. එනම් යථෝක්ත මිෂනාරි සමාගම් විසින් පිහිටුවන ලද මුද්‍රණාල මගින් නිකුත් කොට ඇති පුවත්පත්, ලිපි ලේඛන හා සඟරා මාර්ගයෙන් ක්‍රිස්තියානි ධර්මයේ අදහස් වඩාත් පහසුවෙන් බෞද්ධ ජනතාව අතරට ගෙන ගොස් ඇති  හෙයිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බුදු දහමත්, පෙරදිග සංස්කෘතියත්  වෙනුවට ක්‍රිස්තියානි ආගමත් බටහිර සංස්කෘතියත් රටේ ශීඝ්‍රයෙන් පැතිරෙන්නට විය. විශේෂයෙන් ක්‍රිස්තියානි මිෂනාරීන් බෞද්ධ භික්ෂූන් වහන්සේලාට හා බුද්ධ ශාසනයට එරෙහිව ක්‍රියා කර ගෙන ගිය මේ ප්‍රචාරක කටයුතුවල වඩාත් වර්ධනයක් සිද්ධ වූයේ දහනව වන සියවසේ අග භාගයේදී ය.

ඒ අවධියේ දී යථෝක්ත ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරයට සාර්ථකව මුහුණදීම සඳහා ගිහි පැවිදි බෞද්ධයන්ට සංවිධානයවීමට සිදු විය. විදේශීය පාලනය නිසා යහපත් වී ගිය බුදු දහමත් බෞද්ධයන්ගේ  අයිතිවාසිකම්වලටත් යළි නිසි ස්ථානයක් ලබා දීමේ අරමුණින් යුතුව ගොඩ නංවන ලද ඒ ව්‍යාපාරය ජාතික ශාසනික පුනරුද ව්‍යාපාරය හෙවත් බෞද්ධ ප්‍රබෝධය නම් විය. දහනව වන සියවසේ ඇති වූ මේ  බෞද්ධ ප්‍රබෝධය වූ කලී සියවස් තුනකට ආසන්න කාලයක් විජාතික රජයන් විසින් බුදුදහම මැඬලීමට ගනු ලැබූ උත්සාහය ව්‍යර්ථ කළ මහා ප්‍රයාමයකි.

ඒ අවධියේ දී බෞද්ධ ප්‍රබෝධය මෙහෙයවන ලද බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතර ශ්‍රේෂ්ඨතම භික්ෂුන් වහන්සේ නමක්  වූයේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමිපාණන් වහන්සේය. උන්වහන්සේගෙන් පසුව ජාතික ශාසන පුනරුද ව්‍යාපාරයෙහි උද්දීපනයක් ඇති කිරීම සඳහා පුරෝගාමී වූයේ ගිහි බෞද්ධ නායකයෙකු වූ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ය.

එවක පැවති ආගමික පසුබිම මත මෙතුමාට කුඩා අවධියේම බැප්ටිස් සිංහල පාසල, ශාන්ත බෙනඩික් විද්‍යාලය, කෝට්ටේ ක්‍රිස්තියානි විදුහල සහ ශාන්ත තෝමස් විද්‍යාලය යන

පාඨශාලා මඟින් මිෂනාරි අධ්‍යාපනය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාගැනීමට හැකි විය. පසුව ධර්මපාලතුමාට මිෂනාරි ව්‍යාපාරය දැඩි දෝෂ දර්ශනයට ලක් කරමින් තම ව්‍යාපාරය දියත් කිරීමට පසුබිම උදා වූයේ මේ පාඨශාලාවල දී ක්‍රිස්තියානි පූජකවරුන් වෙතින් බයිබලය හැදෑරීම නිසා මිෂනාරි ධර්මයේ ඇති නිස්සාර බව අවබෝධ වීම හේතුවෙනි. ධර්මපාලතුමා මිෂනාරි පරිසරයක අධ්‍යාපනය ලැබුවත් පානදුරාවාදයෙන් පසුව බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයෙහි හටගත් උණුසුම් වාතාවරණයත් සමඟ තම මෑණියන් වූ මල්ලිකා හේවාවිතාරණ මැතිනියගෙන් හා අති පූජ්‍ය හික්කඩුවේ සිරි සුමංගල නාහිමිපාණන් වහන්සේලාගෙන් ලද ආභාසය මෙතුමා ජාතික හා ශාසනික පුනරුද ව්‍යාපාරයෙහි ක්‍රියාකාරි බෞද්ධ නායකයෙකු බවට පත් කරලීමට හේතු විය. එතුමා විසින් ලියා තබන ලද ස්වයං චරිතාපදාන ලිපියකින් මේ බව සනාථ වේ.

"වයින් පානයෙහි යෙදෙන, මස් බුදින, සැප සම්පත්වලට කැමති මාගේ මිෂනාරි ගුරුවරුන් මෙන් නොව භික්ෂූහු නිහතමානි මෙන් ම පමණ දැන පරිහරණය කරන්නෝ වූහ. ඔවුන්ගේ සමාගමය මම ප්‍රිය කළෙමි. එකත්පස්ව හිඳ මාගේ හිසට ඔරොත්තු නොදෙන තරම් වුවත් ඔවුන්ගේ ධර්ම කතාවලට සවන් දුනිමි."

යථෝක්ත අන්දමට අනගාරික ධර්මපාලතුමා බුදුදහම සම්බන්ධව ලබාගත් දැනුම් සම්භාරය හේතුවෙන් බෞද්ධ වාතාවරණයක් යටතේ දේශීයත්වය ඉස්මතු කරමින් නිසි ජාතික ආගමික පුනරුදයක් ඇති කළ යුතුයි යන්න පිළිබඳව මනා වැටහීමකින් යුක්තව සිටි බව පෙනේ. ඒ සංකල්පය ක්‍රියාත්මක කරලීම පිණිස මෙතුමාට බෞද්ධ පුනරුද ව්‍යාපාරයට ප්‍රවිෂ්ට වීම සඳහා පසුබිම සැකසුනේ ඕල්කට්තුමාගේ ලංකා ගමනයත් සමඟය.

ඕල්කට්තුමා දිවයිනේ බොහෝ ප්‍රදේශවල සංචාරය කොට ගිහිපැවිදි බෞද්ධ ජනතාවගේ ස්වරූපය ප්‍රබෝධකර ගනිමින් පවත්වන ලද දේශනා මාලාවට සහභාගී වීම සඳහා ධර්මපාල තුමාට ද අවස්ථාව උදාවිය. මේ සංචාරයේදී ධර්මපාලතුමාට ස්වකීය අදහස් ජනතාව හමුවේ තැබීමට කටයුතු කරන ලදි. එහෙයින් වැඩිකල් නොයා ම මෙතුමා මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගෙන් පසුව දිවයිනේ ජාතික, ආගමික පුනරුද ව්‍යාපාරය මෙහෙයවන ලද දක්ෂතම කථිකයා බවට පත් විය. ඒ අනුව බෞද්ධ ප්‍රබෝධය තුළ දේශීයත්වයෙහි පුනර්දීප්තියක් ඇති කිරීම සඳහා අනගාරික ධර්මපාලතුමා දියත් කළ අංශ කිහිපයකින් සමන්විත විය.

සිංහල බෞද්ධයන්ගේ ප්‍රෞඪ අතීතයත් සිංහල සංස්කෘතියේ ඇති විශිෂ්ට අතීත උරුම දායාදයනුත් ඉස්මතු කොට පෙන්වා දී පරාධීන හැඟීම්වලින් පීඩිතව එවකට බහුතරයක් වශයෙන් සිටි බටහිර අනුකාරකයන් වන සිංහල බෞද්ධ ජනතාව ජාතික හැඟීම්වලින් පුබුදුවාලීමට ගිහියකු වශයෙන් පළමුවෙන්ම රට පුරා ගොස් ඇත්තේ අනගාරික

ධර්මපාලතුමා ය. ඒ සංචාරයේදී මෙතුමා පවත්වන ලද දේශන මාලාව මගින් බෞද්ධ ජනතාවගේ ඒ බටහිර අනුකාරක සිරිත් විරිත් වැළඳ ගැනීමේ ප්‍රතිපත්තිය ප්‍රථමයෙන් ම ඉමහත් දෝෂ දර්ශනයට ලක් කොට ඇති බව සමකාලීන පුවත්පතක් වූ සිංහල බෞද්ධයා පුවත්පතින් අනාවරණය වේ.

"පුරාතන සිංහලයන්ට ස්වභාවයෙන්ම උරුම වී පුරුදු වී තිබුණු සම්‍යඃ ප්‍රතිපත්ති සියල්ල ම පාහේ අතුරුදහන් වී සිංහල යැයි ගිනිය හැකි නොහැකි තැනට පැමිණ සිටින තරුණ තරුණියෝ දැනට ඉතා බොහෝ ය. එදා වේල කෑමට පවා වත්කමක් නැති දුප්පත් තරුණ තරුණියෝ පර සිරිත ම ප්‍රාර්ථනා කරති. කෑම බීම්, ඇඳුම් පැළඳුම්, යෑම් ඊම් සියල්ලම පර සිරිත් ලෙස ම පුරුදු කර ගනිති."

"අපේ සිංහල ජාතිය දියුණු කරන්ටද, අපේ උතුම් වූ බුද්ධාගම ආරක්ෂා කරන්නටද අද ශ්‍රේෂ්ඨ සිංහලයෝ අප අතර නැත. කලිසම්කාර බුද්ධ ධර්මය නොදත් සිංහල කථා කරන්නට නොහැකි සංකර සිංහල ද්‍රෝහීන් නිසා අපේ උතුම් ජාතිය නැතිවෙන තැනට පැමිණ තිබේ." යනුවෙන් වටහා දෙමින් මෙතුමා අධිරාජ්‍යවාදී පාලනය යටතේ සිංහල බෞද්ධ ජනතාව වැළඳගෙන සිටි බටහිර අනුකාරක ප්‍රතිපත්ති විවේචනයට ලක් කිරීමට පුරෝගාමී වී ඇත.

පූර්වෝක්ත අන්දමින් සිංහල බෞද්ධයන් බොහෝ දෙනෙකු බටහිර අනුකාරකයන් බවට පත් කරලූ අධිරාජ්‍යවාදී පාලකයන්ද හෙළා දැකීම සඳහා ධර්මපාලතුමා පවත්වන ලද දේශනය වඩාත් ප්‍රබල වූ බව පෙනේ.

"සුද්දා සිංහල වර්ගයාගේ හතුරෙකු යනු මගේ කල්පනාවයි. මොහු මේ රටට පැමිණි දින පටන් අපේ ජාතියට ද, අපේ උතුම් නිර්මල ආගමට ද අන්තරායන් පැමිණ තිබේ. සුද්දා මේ රටට පැමිණි තැන් පටන් අපට අවබෝධ කළ ධර්මය නම් සත්ව ඝාතනය, ගෙරි මස් කෑම, හොරකම, කාම මිථ්‍යාචාරය, බොරු කීම, මත්පැන් බීම, අසමගිය ව්‍යාපාදය හා මිථ්‍යා දෘෂ්ටියෙනුත් ය......". යනුවෙන් ජනතාව ඉදිරියේ මෙතුමා තබන අදහස්වලින් මෙය සනාථ වේ.

ධර්මපාලතුමා විසින් මෙරට බෞද්ධ ජනතාව හමුවේ පවත්වන ලද මෙබඳු බොහෝ දේශනයන් නිසා මේ වන විට බටහිර සංස්කෘතියට වහල් වී සිටි ගිහි බෞද්ධයන්ගේ ජනවිඥානය පුබුදු කරමින් ඔවුන්ගේ බොදු චාරිත්‍ර ධර්මයන් මතුකර ගැනීමෙහිලා බෙහෙවින් හේතු වී ඇත.

".... හැමදාම උදේ හෝ හවසට ශරීරය ජලයෙන් පවිත්‍ර කරගනිමින්, මෛත්‍රී භාවනාව ඉගෙන ගනින්, පසළොස්වක දින අටසිල් සමාදන් වෙයන්.... දෙවියන්ට පින් දීපන් ... සිංහල ජාතිය

හා බුද්ධාගම දියුණුවට නිතරම වීර්ය කළ යුතුයි.'' යනුවෙන් පෙන්වා දෙමින් බෞද්ධ වත් පිළිවෙත් වලට ඔවුන් යොමු කරලීමට මෙතුමා පුරෝගාමී විය. ඒ අනුව ධර්මපාලතුමාගේ ආදර්ශ පාඨය වූ "සිංහලයිනි නැගිටිව්' යන සංකල්පය දිවයින පුරා රැව්පිළිරැව් දෙන සටන් පාඨයක් වන තරමට එවකට සිංහලයන්ගේ හීන දීන ගති නැති කොට බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඔස්සේ ක්‍රියාශීලි සිංහල ජාතියක් ගොඩනැගීම සඳහා මෙතුමා ගමින් ගමට ගොස් සිය ව්‍යාපාරය මෙහෙයවා තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගිහි පැවිදි බෞද්ධ ප්‍රබෝධය වටා ඒකරාශී කිරීම සඳහා ධර්මපාලතුමාට සිය ව්‍යාපාරය සමාරම්භයේ දී ම හැකි වූ බව පැහැදිලිය.

ධර්මපාල තුමා පළමුව බෞද්ධ ජනතාව විසින් විදේශීය නම් වැළඳ ගැනීමේ හීනමාන ලක්ෂණය හෙවත් එවක පැවති විලාසිතාව විවේචනයට ලක් කළේය. දේශීයත්වයේ ඇති වටිනාකම කුළුගැන්වීමේ අරමුණින් යුතුව මෙතුමා සිංහල බෞද්ධයන්ගේ ඇඳුම් සෙසු ජාතීන්ගේ ඇඳුම් සමඟ සම කරමින් දිවයිනේ බෞද්ධ ජනතාවට දේශීයත්වයට උචිත ජාතික ඇඳුමක් අවශ්‍ය යැයි යන අදහස ප්‍රථම වරට බෞද්ධ ප්‍රබෝධය ඔස්සේ ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලදි.

ඒ අනුව ...."ජාතික ඇඳුම නැත්තේ සිංහලයාට පමණයි. කලිසමත් සරමත් සිංහලයාට අයෝග්‍යයි. බුද්ධ කාලයේ සිටම උපාසක උපාසිකාවන් ඕදාත වස්ත්‍රය ඇඳ පොරවා තිබේ. අඳින වස්ත්‍රයෙන් ද ව්‍යවහාර නාමයෙන් ද ජාතිය කිව හැකිය. " යනුවෙන් බෞද්ධ ජනතාවගේ ජනවිඥානය අවදි කොට ස්ත්‍රීන් සඳහා ඔසරියත්, පිරිමින් සඳහා ආරිය ඇඳුමත් භාවිතයට ගන්නා ලෙස ධර්මපාලතුමා උපදෙස් දෙන ලදි.

ඒ අනුව පුරුෂයන් සඳහා දණහිස තෙක් විහිදුණු බැනියම ද, ස්ත්‍රී පක්ෂය සඳහා ජෝතිය භාවිත කිරීම උචිත යැයි පෙන්වා දී ඇති බව සඳහන් කොට තිබේ. මේ අනුව බෞද්ධ පුනරුද ව්‍යාපාරය නිසි ජාතික පුනරුදයක් ලෙස අර්ථවත් කිරීමට මෙතුමා මූලික වී ඇති බව පැහැදිලිය. ධර්මපාලතුමා වටහා දෙන ලද යථොක්ත උපදේශයන් පෙරටු කොට ගනිමින් බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ දේශීය අනන්‍යතාව ඉදිරියට ගෙන ගිය බෞද්ධ නායකයන් කිහිප දෙනෙකු පහළ වූහ. ඒ නායකයන් අතර පී. ඇස්. කුලරත්න, ගුණපාල මලලසේකර, ඊ. ඩබ්ලිව්. අදිකාරම්, ඇල්. එච්. මෙත්තානන්ද සහ ආතර් වී දියෙස් වැනි බෞද්ධ දේශප්‍රේමීන් ප්‍රමුඛ ස්ථානයක් ගනී.

ශ්‍රී ලංකාවේ බෞද්ධ කාන්තාවට සිරුරේ ස්වභාවික සෝභාවට ගැළපෙන පරිදි සුදුසු ඇඳුමක් හඳුන්වා දීම බෞද්ධ ප්‍රබෝධය ඔස්සේ ධර්මපාලතුමා ගෙන ගිය දේශීය ව්‍යාපාරයෙහි කැපී පෙනෙන තවත් වැදගත් ලක්ෂණයක් විය. එවකට යුරෝපීය

විලාසිතාවන්ට වහල් වී සිටි බෞද්ධ ස්ත්‍රීන්ට ප්‍රායෝගික අන්දමින් ආදර්ශයක් ලබා දීමේ පරමාර්ථයෙන් යුතු ව ධර්මපාලතුමා කටයුතු කළ බව පෙනේ. ඒ සඳහා එතුමා සිය මෑණියන් වූ මල්ලිකා හේවාවිතාරණ ළමා තැනියට පළමුකොටම ඔසරිය ඇන්ද විය. ශතවර්ෂ ගණනාවකට පසු දේශීය අනන්‍යතාව ඉස්මතු වන අයුරින් ඔසරියත් සාරියත් හැඩ වැඩ ඇති ඇඳුමත් බවට පත් වූයේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

ඉහත සඳහන් අන්දමින් ධර්මපාලතුමා බෞද්ධ පුනරුද ව්‍යාපාරයෙහි දේශීයත්වයට උචිත ලක්ෂණ ඉස්මතු කොට පෙන්වා දී නිසි ජාතික පුනරුදයක් ඇති කිරීම සඳහා ගන්නා ලද උත්සාහය මේ වන විට දිවයිනෙහි පහතරට ප්‍රදේශයෙහි ස්ථාපිත ව තිබූ ඇතැම් බෞද්ධ නිකායන්ගේ ද ආභාසයට හේතු වූ බව පෙනේ. එනම් මෙතුමා දියත් කළ දේශීය සංකල්පයෙහි ප්‍රායෝගිකව ශක්තිමත් පිටුබලයක් වෙමින් රාමඤ්ඤ නිකායේ පුරෝගාමී නාහිමියන් බටහිර අනුකාරක ගිහි සමාජයට පූර්වාදර්ශයක් වන පරිදි තමන් වහන්සේගේ නායකත්වයෙන් පිහිට වූ රාමඤ්ඤ නිකාය සමාරම්භයේදී ම එවකට මෙහි ස්ථාපිතව තිබූ සියම් අමරපුර දෙනිකායටම වෙනස් මඟක් ගනිමින් ඊට සම්පූර්ණයෙන්ම විජාතිකත්වයෙන් මිදුණු දේශීය මුහුණුවරක් දීමට බලවත් උත්සාහයක් ගත්හ. යථෝක්ත නිකායේ අනන්‍යතාව පෙන්වන විශේෂ ලක්ෂණ සියල්ලම ඒ නිකායට දේශීය මුහුණුවරක් දීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයෝ වෙති. රාමඤ්ඤ නිකායේ භික්ෂූන් වහන්සේලා පාරිභෝගයට උවමනා ප්‍රත්‍ය, ගොටු අත්ත, විජිනිපත, පඬුවර්ග ආදි පරිෂ්කාරයන් දේශීය අමුද්‍රව්‍යවලින් නිපදවා ගැනීම මීට නිදසුන්ය.

බෞද්ධ ප්‍රබෝධයේ දේශීය ලක්ෂණ ඉස්මතු කරමින් තවදුරටත් සාර්ථකව ඉදිරියට මෙහෙයවීම සඳහා බෞද්ධ සංවිධානයක් පිහිටුවා ගැනීමට තරම් ධර්මපාලතුමා දියත් කළ ව්‍යාපාරය කෙතරම් දුරට උපකාර වී තිබේදැයි විමසා බැලිය යුතුය. ඕල්කට්තුමා විසින් ආරම්භ කරන්නට යෙදුණු පරම විඥානාර්ථ බෞද්ධ සංගමය එවකට බෞද්ධ පුනරුද ව්‍යාපාරය මෙහෙයවන ලද ප්‍රධාන සංවිධානය විය. එසේ වුවත් ඕල්කට්තුමා දිවයිනට පැමිණීම සඳහා සෑහෙන වැඩ කොටසක් කළ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ඇතුළු ප්‍රධාන පෙළේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාත් ඕල්කට්තුමා විසින් මෙහි පිහිටුවන්නට යෙදුණු පරම විඥානාර්ථ බෞද්ධ සංගමයත් අතර මේ වන විට විශාල වශයෙන් මතභේද හටගෙන තිබුණු බව පෙනේ. මේ පසුබිම මත ධර්මපාලතුමා බෞද්ධ පුනරුද ව්‍යාපාරයෙහි ක්‍රියාකාරී නායකයෙකු බවට පත්වීමටත් ඉන් අනතුරුව එය පුළුල් වශයෙන් මෙහෙයවීමටත් ශක්තිමත් දේශීය බෞද්ධ සංවිධානයක් තිබිය යුතුයි, යන අවශ්‍යතාව එතුමාට අවබෝධ විය.

ධර්මපාලතුමාගේ පුරෝගාමීත්වයෙන් යුතුව ක්‍රි.ව. 1891 මැයි 31 දින මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේදී පිහිටුවා ගන්නා ලද මහබෝධි සංගමය මෙහි ප්‍රතිඵලයක් විය. මහාබෝධි සංගමයේ ආරම්භක සභාපති වූයේ හික්කඩුවේ සුමංගල නාහිමිපාණන් වහන්සේ ය. ගිහි

පැවිදි බෞද්ධ ජනතාවගේ දේශීය සංවිධානයක් වශයෙන් බිහි වූ මහාබෝධි සංගමය මෙරට බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ ඇති වූ පුනර්දීප්තිය විදේශීය රටවල් දක්වා ද ව්‍යාප්ත කරමින් ඒ රටවල බෞද්ධ කටයුතු කෙරෙහි ද නව ආලෝකයක් ලබා දීමට සමත් වී තිබේ.

යථෝක්ත අන්දමට පිහිට වූ මහා බෝධි සංගමය එවකට බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඔස්සේ මෙරට අධිරාජ්‍යවාදී පාලනයට අභියෝගයක් වන පරිද්දෙන් දිවයිනේ බෞද්ධ ජනතාව තුළ ජාතික හා ආගමික කුළුගැන්වීමට තරම් ප්‍රබල දේශීය සංවිධානයක් වශයෙන් කටයුතු කර ඇති බව පෙනේ. එනම් බ්‍රිතාන්‍ය පාලකයන්ට ධර්මපාලතුමාගේ තොරතුරු දැනගැනීම සඳහා සයිමන් ද සිල්වා වාසල මුදලිතුමා විසින් සකස් කරන ලද පහත දක්වා ඇති සටහනින් මෙය අනාවරණය වේ.

"ධර්මපාල මහතා ප්‍රධාන ලේකම්ධුරය දරන මේ සමිතිය අන්තරාදායක එකකි. එය නිතරම ජාතික ආගමික වෛරය ඇවිස්සීමට ආශාවෙන් පසු වෙයි. "

මෙතුමා විසින් ආරම්භ කරන ලද මේ මහාබෝධි සංගමය මඟින් මහාබෝධි නමින් මුද්‍රණාලයක් පිහිටුවා සිංහල, ඉංග්‍රිසි යන භාෂා දෙකින්, "මහාබෝධි" යන සඟරාවක් හා " සිංහල බෞද්ධයා" නමින් පුවත්පතක්ද පළ කරන ලදි. මේ පුවත්පත් සඟරා මඟින් බෞද්ධ පුනර් ව්‍යාපාරයට පුළුල් ප්‍රචාරයක් ලබා දෙමින් එහි උද්දීප්තියක් ඇති කිරීම සඳහා බෞද්ධ ජනතාව තුළ දේශානුරාගී හා ජාතිවාත්සල්‍ය හැඟීම් පුබුදුවාලූ බව පැහැදිලිය.

ධර්මපාලතුමා මේ අන්දමින් දේශියත්වය ඉස්මතු කොට දියත් කළ ව්‍යාපාරයෙහි අදහස් වඩාත් ප්‍රබල අන්දමින් බෞද්ධ මහජනතාව අතරට ගෙන යෑම සඳහා බෞද්ධ ප්‍රබෝධයට හා දේශීයත්වයට ගැලපෙන නිසි ජාතික පුවත්පතක් නොමැතිකමේ අඩුපාඩුව පිළිබඳව ද මනා අවබෝධයකින් යුක්ත ව සිටි බව පෙනේ. බුදුදහම හා දේශීයත්වයට උචිත ජාතික පුවත්පතක් නොමැතිකමේ මේ අඩුපාඩුව එවකට සෑහෙන තරම් දුරට බෞද්ධයන්ට දැනී තිබුණු බව පෙනේ.

ධර්මපාලතුමා දේශීයත්වයට ගැලපෙන අයුරින් නව පුවත්පතක් පළකරන ලද්දේ පූර්වෝක්ත පසුබිම පිළිබඳව මනා වැටහීමකින් යුක්තව සිටි හෙයිනි. 1906 මැයි මාසයේ දී පළ කරන ලද එය සිංහල බෞද්ධයා නම් විය. ඉහත සඳහන් පුවත්පත එවකට සිංහල ජනතාවගේ ජාතික හැඟීම් පුබුදුවාලූ ප්‍රබල මාධ්‍යයක් වූ බව පෙනේ. මේ පුවත්පත ආරම්භ කිරීමේ පරමාර්ථය විස්තර කරමින් ධර්මපාලතුමා කළ ප්‍රකාශයෙන් මෙය අනාවරණ වේ.

"සුද්දන්ට දාසකම් නොකොට සිංහලයන්ට නිදහසේ මඟ පෙන්වීම සඳහා සිංහල බෞද්ධයා පත්‍රය පටන් ගතිමි. අපේ රටේ ජාතික ප්‍රවෘත්ති පත්‍රයක් නැත. මහජනයාගේ අදහස්

කියන්නට පත්‍රයක් නැත. ජාතිය දියුණු කිරීමට හෝ බුද්ධ ශාසනය රැක ගැනීමට පත්‍රයක් නැත."

ජාතික ප්‍රබෝධයත් සමඟ දේශීය වත්පිළිවෙලවලට හුරුපුරුදු වූ ජනතාවක් බිහිකරලීමේ පරමාර්ථයෙන් යුතුව ධර්මපාලතුමා විසින් මේ පුවත්පතට ලියන ලද "දැන ගත යුතු කරුණු" නමින් හඳුන්වන ලද ලිපි මාලාව මඟින් සිංහල බෞද්ධ ජනතාව අතට ගෙන යන ලද අදහස් ජාතික ආගමික චාරිත්‍ර ධර්මයන් සම්බන්ධව ඔවුන්ගේ ජනවිඥානය පුබුදු කිරීමෙහිලා බෙහෙවින් උපකාරී වූ බව පෙනේ. ඒ ලිපි අතර එන සිංහල වීරවරයන් අනුගමනය කිරීම, සංකර සිරිත් අතහැර ආරිය සිරිත් ගරු කිරීම, ඇඳුම් පැළඳුම්වලින් හා නම් ගම්වලින් ආර්ය සිංහලයන් බව පෙන්වීම, ගෘහ ජීවිතයේදී හා සමාජයේදී ඉරියව් පැවැත්විය යුතු අන්දම යන මාතෘකාවලින් සමන්විත වූ ලිපි මගින් ධර්මපාලතුමා වටහා දෙන ලද අදහස් ජාතියට දුන් ශ්‍රේෂ්ඨ ආදර්ශයන් විය. මෙතුමා දියත් කළ දේශීය ව්‍යාපාරයෙහි අදහස් අධිරාජ්‍යවාදී පාලනයට අභියෝගයක් වන අන්දමින් බෞද්ධ ජනතාව අතරට ගෙන යෑම සඳහා සිංහල බෞද්ධයා පුවත්පත ඒ වන විටත් වැදගත් කාර්යභාරයක් සිදු කොට ඇති බව පෙන්වා දිය හැකිය. මක්නිසාද යත් 1915 ඇරඹි කැරලි කෝලාහාල සමයෙහි ලංකා ආණ්ඩුවේ නියෝගයකින් අත්හිටුවන ලද මේ පුවත්පත 1922 ජූලි මාසයේදී නැවත ආරම්භ කිරීමට මෙය සනාථ වන වැදගත් සාක්ෂියකි.

මේ පිළිබඳව වැඩිදුරටත් කරුණු විමසා බැලීමේදී එකල ජාතික හැඟීම් කුළුගන්වන ලද පුවත්පත් බොහෝ ගණනක් පළ වී ආවේ සිංහල බෞද්ධයා පුවත්පත මඟින් ජාතික ව්‍යාපාරයෙහි ඇති කරන ලද උද්දීපනය හේතුවෙනි. එනම් ධර්මපාලතුමා අනුගමනය කරන ලද බෞද්ධ නායකයන් හැටියට සැලකෙන එච්. එස්. පෙරේරා, පියදාස සිරිසේන වැනි දේශප්‍රේමීන් පුවත්පත ප්‍රබල මාධ්‍යය කර ගෙන ඒ අවධියේ නිසි ජාතික ප්‍රබෝධයකට මං පෑදූ දිනමිණ සහ සිංහල ජාතිය යන පුවත්පත් බිහිකරන ලද්දේ මෙතුමා විසින් ආරම්භ කරන ලද යථෝක්ත පුවත්පත ගුරුකොට ගැනීමෙනි. විශේෂයෙන් ම මේ පුවත්පත මඟින් ජාතික නිදහස පිළිබඳව හැඟීම් අවදි කරලීමට තරම් හැකියාවක් ඇතිව සිටි වියත් පඬිවරු රැසක් ද බිහි කරන ලද බව පෙනේ. ඒ අය අතර පියදාස සිරිසේන, ඩී. ඩබ් වික්‍රමාරච්චි, ඩේවිඩ් කරුණාරත්න, වලිසිංහ හරිස්චන්ද්‍ර, තෝමස් කරුණාරත්න, ජූලියස් ද ලැනරෝල්, ඩබ්. ඩබ්. කරුණාරත්න, අයි. ඇම්. ඒ. ඊරියගොල්ල සහ හේමපාල මුනිදාස යන ගිහි බෞද්ධයන් ප්‍රමුඛස්ථානයක් ගනී. මේ අනුව බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය වටා මේ දේශප්‍රේමී උගතුන් ඒකරාශී වූයේ ද යථෝක්ත පුවත්පතෙහි කතෘත්වය දරමින් ධර්මපාල තුමා දියත් කළ දේශීය ව්‍යාපාරයේ අනුගාමිකයන් වශයෙනි.

ජාතික ආගමික ප්‍රබෝධය ඔස්සේ ධර්මපාල තුමා දියත් කළ දේශීය ව්‍යාපාරයෙහි පුරෝගාමීත්වය මෙරට අමද්‍යප ව්‍යාපාරය කෙරෙහි බලපා ඇති ආකාරය මෙහි දී විමසා

බැලීම වැදගත් වේ. බ්‍රිතාන්‍ය පාලකයන් විසින් දිවයිනෙහි ගම් ප්‍රදේශවල රා තැබෑරුම් විවෘත කිරීමේ නීත්‍යානුකූල අවසරය ලබා දෙන ලද්දේ 1912 දී පනවන ලද සුරාබදු ආඥාපනතෙනි. මද්‍යපානයට විරුද්ධව මේ වන විට දකුණේ කොග්ගල ප්‍රදේශයෙහි පී. ඒ. ද සිල්වා නැමැති බෞද්ධයෙකු විසින් සුරා විරෝධී ව්‍යාපාරයක් අරඹා තිබිණි. මේ අන්දමට දකුණු ප්‍රදේශයෙන් අමද්‍යප ව්‍යාපාරයෙහි මූල බීජනයන් ආරම්භ වුවද කොළඹ කේන්ද්‍රස්ථානය කොටගෙන මෙය දීප ව්‍යාප්ත ව්‍යාපාරයක් බවට පත් කිරීම සඳහා ප්‍රබල මහජන මතයක් ගොඩනැගීමට පුරෝගාමී වී ඇත්තේ ධර්මපාලතුමා විසින් බව පෙනේ. මක්නිසාදයත් මෙතුමා දිවයිනේ බොහෝ පෙදෙස්වල සංචාරය කරමින් බෞද්ධ ප්‍රබෝධයෙහි උද්දීපනය ඇති කිරීම සඳහා සිය දේශීය ව්‍යාපාරය අරඹන ලද්දේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් සුරාබදු ආඥාපනත පනවන ලද යථෝක්ත වර්ෂයේ වන හෙයිනි.

ඒ සංචාරයේදී ධර්මපාලතුමා මද්‍යපානයට විරුද්ධව ජනතාව හමුවේ තබන ලද අදහස් දේශීය බෞද්ධ ජනතාව තවදුරටත් බෞද්ධ පුනරුද ව්‍යාපාරය වටා ඒකරාශී කිරීමට තරම් ප්‍රබල මාධ්‍යයක් විය. මෙතුමා, "හරක් මස් නොකනු, සුරා නොබොනු" යන ආදර්ශ පාඨය පෙරටු කොට ගෙන පවත්වන ලද දේශන මාලාව නිසා ගිහි බෞද්ධ ජනතාව තුළ ඇති වූ ජාතික ප්‍රබෝධය පුනරුද ව්‍යාපාරයෙහි ඉදිරි ගමනට මඟ හෙළි කරන ලද බව පැහැදිලිය. ධර්මපාලතුමා දේශනා මඟින් පමණක් නොව සිංහල බෞද්ධයා පුවත්පත මඟින් ද මේ අමද්‍යප සටන මහජනතාව අතරට ගොස් තිබෙන බව පෙනේ.

"..... සිංහලයින් මත්පැන් බොන්ට පුරුදු කරන මිථ්‍යා දෘෂ්ටීන්ගෙන් .. බේරෙන්ට උපා යොදනු. අප ජාතිය නැතිවීමට බීම හේතු වී තිබේ. ඉන් නිසා මේ පරජාතිකයන් විසින් ගෙනත් අප ගෙවල් ළඟ පුරවන මත්පැන් බොන්න එපා. මත්පැන් පානය අතහැර මෛත්‍රිය වර්ධනය කරමින් ........... අපේ දූ පුතුන්ට ශාස්ත්‍ර ශිල්ප ඉගැන්වීමට ධනය වියදම් කළ යුතුයි..."

මෙතුමාගේ පුරෝගාමීත්වයෙන් අමද්‍යප කටයුතුවල සිදු වූ වර්ධනය නිසා ජාතියට නව එළියක් ලබා දුන් ශ්‍රේෂ්ඨ අමද්‍යප නායකයන් කිහිප දෙනෙකු බිහි විය. ඔවුන් අතර හේවා විතාරණ සහෝදරවරු, වලිසිංහ හරිස්චන්ද්‍ර, පියදාස සිරිසේන, ඩබ්ලිව්. ආතර් ද සිල්වා, ආතර් වී. දියෙස්. අමදෝරිස් මැන්ඩිස් හා මාටින් සී. පෙරේරා යන දේශ ප්‍රේමීන් ප්‍රමුඛ ස්ථානයක් ගෙන ඇත. මේ බෞද්ධ නායකයන් බෞද්ධ ප්‍රබෝධයටත්, ජාතික ව්‍යාපාරයටත් අතිවිශිෂ්ට සේවාවක් සිදු කිරීමට තරම් පුළුල් අත්දැකීම් සම්භාරයක් හිමි කර ගනු ලැබුවේ ධර්මපාලතුමා විසින් දියත් කරනු ලැබූ දේශිය ව්‍යාපාරයේ මාර්ගෝපදේශකත්වයෙනි.

අධිරාජ්‍යවාදී පාලනය නිසා ජාතික ශාසනික කටයුතු අතින් පමණක් නොව ආර්ථික කටයුතු අතින් ද මේ වන විට පීඩාවට පත්ව සිටි බෞද්ධ ජනතාවට දේශියත්වයට ඔබින ශක්තිමත්

ආර්ථික පදනමක් ඇති කිරීම සඳහා ධර්මපාලතුමා දියත් කළ ව්‍යාපාරය පුරෝගාමී වී ඇති අයුරු මීළගට විමසා බැලිය යුතුය.

ජාතික පුනරුදයක් මගින් නිදහස් ප්‍රතිලාභ අත්පත් කරගැනීමට නම් දේශීය ආර්ථික පදනමකින් බෞද්ධ ජනතාව ශක්තිමත් විය යුතු බව ඕල්කට්තුමා සමඟ කළ ප්‍රථම සංචාරයේදී ම ලත් අත්දැකීම් තුළින් ධර්මපාලතුමාට මනා වැටහීමක් පැවතිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එවකට පිරිහීමට පත් ව තිබූ විරාගත ශිල්ප කර්මාන්තවල  අගය පහදා දෙමින් බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඔස්සේ පළමුවරට දිවයිනේ දේශීය කර්මාන්ත ප්‍රායෝගික අන්දමින් පුනර්ජීවයක් ලබා දෙන ලද්දේ ධර්මපාලතුමා විසිනි. මේ සඳහා මෙතුමා විසින් ගෙන ගිය ආර්ථික ප්‍රතිසංස්කරණය ක්‍රියාවලියේ ප්‍රධාන තේමාව වූයේ "අපේ  රටවැසියනට වැඩ සපයනු පිණිස අපේ කර්මාන්තවලට පුනර්ජීවනයක් දෙමු" යන්නයි. ධර්මපාලතුමා විසින් යථෝක්ත ආර්ථික සංකල්පය බෞද්ධ ජනතාව අතට ගෙන ගොස් ඇත්තේ  සිංහල බෞද්ධයා පුවත්පත මගිනි. එමගින් විරාගත දේශීය ශිල්ප කර්මාන්තවල පුනරුදයක් ඇති කිරීම සඳහා දේශීය ජනතාව මනා අවබෝධයක් ලබා දී ඇති බව පෙනේ.

"සිංහල වාණිජ ශාලා තනන සිංහල හස්ත කර්මාන්ත දැක්වීම කළයුතුයි. බට පොතුවලින් තනන ද්‍රව්‍ය ප්‍රියදර්ශනීය කරවීමට සිංහල ශිල්පීන් වීරිය කට යුතුයි. උක් වවා සර්කලා සිංහලයින් කට යුතුයි. පිටරටින් ගෙනෙන කපු පිළි නවත්වා ස්වදේශ යන්ත්‍ර වලින් තනන චීවර ඇඳීම කළ යුතුයි."

"තමන් .... අඳින වස්ත්‍රය ස්වකීය හස්තයෙන් ම වියාගෙන ඇඳීම දියුණු වී සිටින මනුෂ්‍යයාගේ ධර්මයකි. ලංකාවේ ගමක් ගමක් පාසා කපු වැවීම කටයුතුයි .... ගෙදරක් පාසා චර්කාවක් තබාගෙන කපු සූත්‍ර තැනිය යුතුයි."

මේ අන්දමට බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඔස්සේ තම රටට අවශ්‍ය දේ සිය රටෙහි ම නිපදවා ගත යුතුයි යන ප්‍රතිපත්තිය ජනතාව හමුවේ තැබූ ධර්මපාලතුමා එය ප්‍රායෝගික වශයෙන් ද ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා මූලික පියවරක් වශයෙන් මෙතුමා අත්කම්වල හා කර්මාන්තවල පුහුණුවක් දේශීය තරුණියන්ට ජපානයේදී ලබාදීම පිණිස තම පියාණන් ලවා ශිෂ්‍යත්ව ක්‍රමයක් පිහිටු විය. ඒ ශිෂ්‍යත්ව ක්‍රමය මගින් යූ. බී. දොළහිල්ලේ පේෂ කර්මාන්තයත්, බියන්විල  බාලසූරිය ගිනිපෙට්ටි කර්මාන්තයත්, හින්නි අප්පුහාමි විසිතුරු මල් කර්මාන්තයත්, වෙයන්ගොඩ විජයබන්දු පිඟන් කර්මාන්තයත් හැදෑරීම සඳහා ජපානයට යැවීම මීට නිදසුන්ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විසිවන සියවස මැද භාගය පමණ වන විට මෙරට දේශීය කර්මාන්ත කිහිපයක් බිහි විය. ඒවා අතර දොළපිහිල්ලේගේ පුරෝගාමීත්වයෙන් අරඹන ලද පේෂ කර්මාන්තය හා බියන්විල බාලසූරියගේ මූලිකත්වයෙන් පිහිටවනු ලැබූ අලියා ලකුණ දරන ගිනි පෙට්ටි කර්මාන්තය වැනි දේශීය ව්‍යාපාරයත්

දිවයිනට ප්‍රථම වරට හඳුන්වා දෙන ලද්දේ ධර්මපාලතුමා විසින් බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඔස්සේ වටහා දෙන ලද දේශීය ආර්ථික සංකල්පයෙහි ප්‍රයෝගික පැත්තට පිටුබලයක් වන අයුරිනි.

මේ අන්දමට ධර්මපාලතුමා විසින් දේශීයත්වය අගය කරමින් දියත් කරන ලද ව්‍යාපාරය දිවයින විදේශීය ආධිපත්‍යයෙන් මුදවා ගැනීමට සඳහා කොතරම් දුරට උපස්තම්භක වී තිබේ දැයි අවසාන වශයෙන් විමසා බැලීම වැදගත් වේ.

එවකට අධිරාජ්‍යවාදී පාලනයට විරුද්ධව බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඔස්සේ ප්‍රබල හඬක් නැංවීමට ධර්මපාලතුමා පුරෝගාමී වී ඇති බව පෙනේ. මක්නිසාද යත් එතුමා විසින් ක්‍රි.ව. 1908 දී බ්‍රිතාන්‍ය ආණ්ඩුව වෙත ඉදිරිපත් කළ ආයාචනයෙහි "විමුක්ති දායකයන් වහන්සේගේ ශාන්තිදායක ධර්මය පදනම් කර ගත් පුරාණ සම්ප්‍රදායට අනුකූලව දේශීය ස්වයං පාලනයක් ලබා දිය යුතුයි", යනුවෙන් සඳහන් වී ඇති හෙයිනි. ධර්මපාලතුමා විසින් දියත් කරන ලද මේ ව්‍යාපාරය හේතුවෙන් එවකට දිවයිනේ බ්‍රිතාන්‍යය ආණ්ඩුව සෑහෙන තරම් දුරට අපහසුතාවයට ලක් වී තිබූ මෙතුමා පිළිබඳව පොලිස්පතිවරයා විසින් 1922 ජුනි 17 වන ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවෙන් අනාවරණය වේ.

ඒ වාර්තාවේ පෙන්වා දෙන අන්දමට "මොහු ඉක්මනින් ම ඉවත් කර ගැනීම පරිස්සම් සහිතයි. ඔහු අයහපතක් කිරීමට මිස යහපතක් කිරීමට නොයයි. මේ ආකාරයෙන් යටත් විජිතය තුළ සිටින තාක් ඔහු වඩා වැඩි අන්තරාදායක පුද්ගලයෙකු බවට පත් වේ. ඔහු අතෘප්තිය වැපිරීමෙහි යෙදී සිටීමෙන් කළබල හටගනු ඇත. ධර්මපාල ගැන කටයුතු කිරීමේ පහසු ක්‍රමය ඔහුට රටින් පිට වී යන ලෙස දැනුම් දීමයි"
යනුවෙන් සඳහන් වී තිබීමෙන් පැහැදිලි වේ. මේ අනුව බලන විට විසිවන සියවසේ නිදහස් සටන මෙහෙය වූ ලාංකික ජන නායකයා වන්නේ ධර්මපාලතුමායි. එතුමා විසින් දිවයින විදේශ ආධිපත්‍යයෙන් මුදවා ගැනීමේ අවශ්‍යතාව බෞද්ධ ප්‍රබෝධය ඉස්මතු කරන ලදි.

දෙස, බස, රැස රැකගැනීම වෙනුවෙන් දිවි පරදුවට තබා ශ්‍රේෂ්ඨ ව්‍යාපාරයන්හි යෙදුණු අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ අවසන් කාලයේ ඉන්දියාවේ "සිරිදේව මිත්ත ධර්මපාල "නමින් මහනදම් පුරන ලදි. ජීවිතයේ අවසාන කාලයේ ශ්‍රී ලාංකික සමාජය කෙරෙහිම කලකිරීමෙන් ජීවත් වූ උන්වහන්සේගේ අවසන් ප්‍රකාශය වූයේ "බුදු දහමේ ආරක්ෂාව හා ප්‍රචලිත කිරීම සඳහා මම නැවතත් ඉන්දියාවේ ම ඉපදේවායැ යි" යන්න යි.